අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/17/05/SI

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.06.06.

චක්‍රලේඛ අංක - 2024/14

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාසභාර නි.අ.අ./ස.අ.අ වරුන්
සියලුම විදුහල්පතිවරුන්

**පාසල්වල යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම හා නව නිපැයුම් කරග පැවැත්වීම.**

## 1.0 හැඳින්වීම

අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි දරු පරපුරක් පාසල් පද්ධතිය මගින් බිහි කිරීම යුගයේ අවශ්‍යතාව වේ. නව ප්‍රවණතාවන්ට අනුගතවීමටත්, ගවේෂණය හා පර්යේෂණ ඔස්සේ නිර්මාණාත්මක චින්තනය මෙහෙයවා නව නිපැයුම් බිහි කිරීමටත්, ඒවා වැඩි දියුණු කර බුද්ධිමය දේපළ හිමිකම ලබා ගෙන ව්‍යවසායකත්වය කරා පාසල් දරුවන් යොමු කරවීමත්, පාසල් නව නිපැයුම් සමාජ බිහි කිරීම මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව පාසල් වල යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීමට කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියාමාර්ග හා උපදෙස් අනුගමනය කළ යුතු වේ.

## 2.0 පාසල් නව නිපැයුම් සමාජ පිහිටු වීම.

2.1 දිවයිනේ සියලුම 1AB, 1C, 2 වර්ගයේ පාසල් වල යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීමට කටයුතු කළ යුතු වේ. මේ පිළිබඳව අදාළ උපදෙස් අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, පස්වන මහළ, "මෙහෙවර පියස", ගොඩනැගිල්ල, කොළඹ 05 ලිපිනයෙන් ලබා ගත හැකිය.

2.2 පාසල් යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීමෙන් පසුව එම සමාජය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වෙබ් අඩවියේ (www.slic.gov.lk ) ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු වේ. ඊට සමගාමීව ඒ පිළිබඳ විස්තර අධ්‍යාපන අමාත්‍යාංශයේ, තාක්ෂණ අධ්‍යාපන ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැන්වීමට පියවර ගත යුතුය.

### 3.0 යොවුන් නව නිපැයුම් සමාජ සංයුතිය

විදුහල්පති, පාසල් යොවුන් නව නිපැයුම් සමාජයේ ගරු අනුශාසක වේ. පාසලේ තාක්ෂණික ගුරුවරයා හෝ වෙනත් නිර්මාණශීලී ගුරුවරයකු හෝ නව නිපැයුම් සමාජයේ අනුශාසක වශයෙන් විදුහල්පති විසින් නම් කළ යුතු වේ.

පාසලේ නව නිපැයුම්කරණයට ලැදි ඕනෑම ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට නව නිපැයුම් සමාජයේ සාමාජිකත්වය ලබා ගැනීමට හැකි ය. නව නිපැයුම් සමාජයේ සංයුතිය ඇමුණුම 01 හි දක්වා ඇත.

### 4.0 පාසල් නව නිපැයුම් තරඟ

4.1 තරඟ අදියර පහකි.

i. පාසල් නව නිපැයුම් තරඟ
ii. කලාප නව නිපැයුම් තරඟ
iii. පළාත් නව නිපැයුම් තරඟ
iv. ජාතික නව නිපැයුම් තරඟය
v. අන්තර් ජාතික නව නිපැයුම් තරඟ

4.2 මෙම තරඟ අදියර පහෙන් පළමු අදියර හතර, වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන අතර අවසාන අදියර අවස්ථාව ලැබෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

### 5.0 පාසල් නව නිපැයුම් තරඟ

පාසලේ වාර්ෂික ක්‍රීඩා තරඟවලට සමගාමීව හෝ පාසලේ නිවාසාන්තර තරඟයක් වශයෙන් හෝ පාසල් නව නිපැයුම් තරඟ පැවැත්වීම සුදුසු වේ. පළමුවන පාසල් වාරය අවසාන වීමට පෙර සියලුම පාසල්වල නව නිපැයුම් තරඟ පවත්වා අවසන් කළ යුතු වේ. විනිශ්චය මණ්ඩලය පාසල් කළමනාකරණ මණ්ඩලය තුළින් තෝරා ගැනීම සුදුසු වන අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියෝජිතයකු විනිශ්චය මණ්ඩලය සඳහා තෝරා ගැනීම වැද කටයුතු කළ යුතු ය. විදුහල්පතිවරයා විනිශ්චය පිළිබඳ අවසන් තීරක වශයෙන් කටයුතු කළ යුතු ය. තරඟයට ඉදිරිපත් කරන සෑම නිර්මාණයක් සඳහාම සහභාගිත්ව සහතිකයක් ලබා දීමත්, ඉහළ නිර්මාණශීලීබව පෙන්වන නිර්මාණ සඳහා සහතික පත් ලබා දීමට අමතරව ත්‍යාග හා / හෝ පදක්කම් ලබා දීමටත්, කටයුතු කළ හැකිය. කෙසේ වුවද ත්‍යාග හා පදක්කම් ලබා දීම පිළිබඳව විදුහල්පති විසින් තීරණය ගත යුතු අතර ඒ සඳහා පිරිවැය පාසල විසින්ම උපයා ගත යුතු වේ. පාසල් නව නිපැයුම් තරඟයෙන් ස්ථාන (ප්‍රථම, දෙවන, තෙවන හා කුසලතා) ලබා ගන්නා නිර්මාණ කලාප නව නිපැයුම් තරඟයට ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සෑම වසරකම මාර්තු මාසය අවසාන වීමට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කළ යුතු වේ.

### 6.0 කලාප නව නිපැයුම් තරඟ

පාසල් නව නිපැයුම් තරඟවලින් තෝරා ගන්නා ලදුව, විදුහල්පති විසින් නම් කරන ලද නව නිර්මාණ, කලාප නව නිපැයුම් තරඟය සඳහා සුදුසුකම් ලබයි. කලාප නව නිපැයුම් තරඟය කලාප

අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්, කලාප නව නිපැයුම් සම්බන්ධීකරණ අධ්‍යක්ෂ මගින් සංවිධානය කළ යුතු වේ. අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ඒකාබද්ධව පුහුණු කරන ලද විනිශ්චයකරුවන්ගේ කලාප නව නිපැයුම් තරඟ විනිශ්චය මණ්ඩලය සමන්විත වේ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් විමසා විනිශ්චය මණ්ඩලය ලබා ගත යුතු වේ. කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කලාප නව නිපැයුම් තරඟයන්හි ප්‍රධාන තීරක වශයෙන් කටයුතු කළ යුතු වේ. කලාප තරඟ සඳහා ඉදිරිපත් වන සෑම නව නිර්මාණයක් සඳහාම සහභාගීත්ව සහතිකයක් ලබා දීම සුදුසු ය. ඉහළ මට්ටමේ කුසලතා දක්වන නව නිර්මාණ සඳහා සහතිකපත් ලබා දිය යුතු අතර, ත්‍යාග හා /හෝ පදක්කම් ලබා දීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පවත්නා ප්‍රතිපාදන මත තීරණය කළ යුතුය. කලාප තරඟ සඳහා අවශ්‍ය වියදම් කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් සපුරා ගත යුතු වේ. කලාප නව නිපැයුම් තරඟයෙන් තෝරා ගන්නා ඉහළම කුසලතා සහිත නව නිපැයුම් (10-20 අතර සංඛ්‍යාවක් වීම සුදුසුය) පළාත් තරඟ සඳහා ඉදිරිපත් කිරීමට තෝරා ගත යුතුයි. ඒ පිළිබඳව විස්තර සෑම වර්ෂයකම ජූනි 30 දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා යැවීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතු වේ.

## 7.0 පළාත් නව නිපැයුම් තරඟ

සෑම වර්ෂයකම අගෝස්තු මස 31 දිනට පෙර පළාත් නව නිපැයුම් තරඟය පවත්වා අවසන් කළ යුතු ය. පළාත් නව නිපැයුම් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා සම්බන්ධීකරණයෙන් මෙම තරඟයන් සංවිධානය කළ යුතු වේ. විනිශ්චය මණ්ඩලය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් සපයනු ලබන අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන අධ්‍යක්ෂක තීරක වශයෙන් කටයුතු කරනු ඇත. පළාත් නව නිපැයුම් තරඟය සඳහා සහභාගී වන සෑම ශිෂ්‍ය නව නිපැයුම්කරුවකුටම සහභාගීත්ව සහතිකයක් පිරිනැමේ. කුසලතා සහිත නිර්මාණ සඳහා කුසලතා සහතික ද, අපේක්ෂිත ප්‍රවීණතාව සහිත නව නිර්මාණ සඳහා සහතික පත්, ත්‍යාග හා පදක්කම් ද පිරිනමනු ලැබේ. පළාත් නව නිපැයුම් තරඟයට අදාළ වියදම් ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම විසින් දරනු ඇත. පළාත් නව නිපැයුම් තරඟයෙන් තෝරා ගන්නා ස්ථාන (ප්‍රථම, දෙවන,තෙවන) ලබා ගන්නා සියලු නව නිපැයුම්, සහසක් නිමැවුම් තරඟයෙහි නිර්ණායකයන්ට අනුකූලව ජාතික තරඟය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

## 8.0 ජාතික නව නිපැයුම් තරඟය

ජාතික නව නිපැයුම් තරඟය සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මාසය තුළ පැවැත්වේ. ජාතික නව නිපැයුම් තරඟය සංවිධානය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සිදු කරනු ලැබේ. විනිශ්චය මණ්ඩලය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පත්කරනු ලබන අතර කොමිසමේ පාලක මණ්ඩලය අවසාන තීරක වශයෙන් කටයුතු කරයි. ජාතික නව නිපැයුම් තරඟයට ඉදිරිපත් වන සෑම නිපැයුමක් සඳහාම සහභාගීත්ව සහතිකයක් හිමි වන අතර ඉහළ මට්ටමේ කුසලතා සහිත නිර්මාණ සඳහා සම්මාන ත්‍යාග හා පදක්කම් හිමි වේ.

**9.0 අන්තර් ජාතික නව නිපැයුම් තරගය**

9.1 ජාතික මට්ටමේ තරගයෙන් තෝරා ගන්නා නව නිපැයුම් 5 -10 අතර සංඛ්‍යාවක් (වර්ෂයේ ප්‍රතිපාදන සීමාව අනුව මෙය තීරණය වේ.) මේ සඳහා ඉදිරිපත් කරන අතර ඒවා නිර්මාණය කළ සිසුන් ද අන්තර් ජාතික නව නිපැයුම් තරග සඳහා අවස්ථාව ලැබෙන පරිදි සහභාගී කරවනු ලැබේ.

9.2 පාසල් නව නිපැයුම් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය අන්තර් ජාතික තලයේ නිර්මාණශීලීත්වය පිළිබඳ අවබෝධය ලබා දීමේ අරමුණින් නව නිර්මාණය සඳහා සෘජුවම දායකත්වය ලබා දෙන නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ට අන්තර් ජාතික නව නිපැයුම් තරගවලට සිසුන් සමග සහභාගීවීමේ අවස්ථාව හිමිවනු ඇත. ඒ සඳහා සම්පූර්ණ වියදම පෞද්ගලිකව දරාගැනීමට සිදුවන අතර පවත්නා මූල්‍ය ප්‍රතිපාදන තත්ත්වය මත සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දීමට කටයුතු කරනු ඇත.

**10.0 පේටන්ට් බලපත්‍ර ලබා දීම හා ව්‍යවසායකත්වයට යොමු කිරීම.**

ජාතික නව නිපැයුම් තරගයේ දී තෝරා ගන්නා හොඳම නව නිර්මාණ බුද්ධිමය දේපළ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය බුද්ධිමය දේපළ කාර්යාංශය මඟින් ලබා දීමට කටයුතු කරනු ඇත. එමෙන්ම ව්‍යාපාරික තත්ත්වයට දියුණු කළ හැකි යැයි කොමිසම විසින් තීරණය කරනු ලබන නව නිපැයුම්, ඒ සඳහා සුදුසු ව්‍යවසායකයකු කෙරෙහි යොමු කරවීම හා නිර්මාණකරුවාට මෙහි ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මැදිහත් වනු ඇත.

**11.0 වෙනත්**

11.1 ඉහත සෑම අදියරකම තරග සඳහා නව නිපැයුම් ඉදිරිපත් කරන සිසුන් තමාගේ නව නිපැයුමට අදාළ කාර්යසාධන වාර්තාවක් පවත්වාගෙන යාම සුදුසු වේ. යම් කිසි ශිෂ්‍යයකු තමන් විසින් නව නිපැයුමක් නිර්මාණය කළ විගස එය තමාගේ නමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වෙබ් අඩවියේ තම පාසල් නව නිපැයුම් සංගමයට අයත් වෙබ් පිටුවේ ලියාපදිංචි කළ යුතු වේ.

11.2 අන්තර් ජාතික නව නිපැයුම් තරග සඳහා සුදුසුකම් ලබා විදේශ චාරිකාවක් සඳහා තෝරා ගත් බව දන්වා ඇති සිසුන් පහත දැක්වෙන අවශ්‍යතාවන් කඩිනමින් සම්පූර්ණ කර ගත යුතු වේ.

i. විදේශ ගමන් බලපත්‍ර ලබා ගත යුතු අතර එහි වියදම ශිෂ්‍යයාගේ වියදමින් දරාගත යුතු වීම

ii. විදේශ ගමනට සහභාගී වීම සඳහා දෙමාපියන්ගේ අවසරය ලබා දෙන ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

iii. තමාගේ පාසලේ ශිෂ්‍යයකු බව සනාථ කරන හා විදේශ ගමන් යාමට නිර්දේශ කරන බවට විදුහල්පති විසින් නිකුත් කළ ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

iv. ශිෂ්‍යයාගේ ජීව දත්ත සඳහන් ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් ලේඛනවල පිටපත් නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතට ද ලබා දිය යුතුය.

11.3 අදාළ වර්ෂයේ දී ඉදිරිපත් කෙරෙන නව නිපැයුම් සඳහා සිසුන් මෙහෙයවන ලද ගුරුභවතුන් අතරින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගන්නා ගුරු පිරිසක් අන්තර් ජාතික නව නිපැයුම් තරගවලට සහභාගි කරවනු ඇත. එම ගුරු සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර ගුරුවරුන් තෝරා ගැනීමේ දී ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ පාලක මණ්ඩලයේ නිර්දේශය ද පදනම් කරගනු ඇත. කෙසේ වෙතත් මෙම අවස්ථාව තත්කාලීනව පවතින මූල්‍ය පහසුකම් මත තීරණය වනු ඇත.

11.4 පාසලේ නව නිපැයුම් සමාජයේ සභාපති ගුරුභවතා ස්ථාන මාරුවී යාමේ දී එයින් පාසල් නව නිපැයුම් සමාජයේ කටයුතුවලට බාධා වීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පියවර ගැනීම ඉතාම වැදගත් වේ.

11.5 ඉහළ තත්වයේ නව නිපැයුම් ඉදිරිපත් කරන සිසුන් පාසලේ පිළිගැනීමකට ලක් කිරීමට පියවර ගැනීම සුදුසු ය.

11.6 නව නිපැයුම් සඳහා බුද්ධිමය දේපල අයිතිය ලබා ඇති සියලු ම නව නිපැයුම්කරුවන් ජනාධිපති සම්මාන තරගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබනු ඇත. එම තරගයට ඉදිරිපත් වීම සඳහා අදාළ ආකෘති පත්‍ර ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් බලපත්‍ර හිමි නව නිපැයුම්කරු වෙත තැපැල් මගින් ලබා දෙනු ඇත.

11.7 මගේ සමාංක හා 2006.06.06 දිනැති අංක 2006/23 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලබන බවත් භාෂා පරිවර්තන අතර අනනුකූලතාවක දී සිංහල පිටපත බලාත්මක වන බවත් වැඩිදුරටත් දන්වමි.

Jayasundara

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත්:

1. අධ්‍යක්ෂ (ජාතික පාසල් ), අධ්‍යාපන අමාත්‍යාංශය - කරු දැ.ගැ.පි
2. අධ්‍යක්ෂ (පාසල් කටයුතු ), අධ්‍යාපන අමාත්‍යාංශය - කරු දැ.ගැ.පි

# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## පාසල් යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම




දුරකථන - 011-2676650
ෆැක්ස් - 011-2676646
වෙබ් අඩවිය - www.slic.gov.lk
විද්‍යුත් තැපැල - info@slic.gov.lk
Youtube නාලිකාව - Sri Lanka Inventors

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
05 වන මහල,
"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
කොළඹ 05.